# සීලය

දිවිමගට සිසිලස සහනය සතුට සලසාලන කායික - වාචසික සංවරය සීලයයි. ලෝවැසියන් කෙරෙහි ඉමහත් කරුණාවෙන් යුතුව බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළ සීලය මගින් සත්ත්වයන්ට සිදුවන අනේකවිධ කරදර - සම්බාධ මගහරවා ගැනීමට අවස්ථාව සැලසේ. එමගින් මෙලොව වශයෙන් සිදුවිය හැකි නින්දා, අපහාස, ධනහානි, රෝගපීඩා, මානසික පීඩා, පසුතැවීම්, පාපමිත්‍ර ඇසුර, ආර්ථික දුෂ්කරතා ආදිය මගහරවා ගැනීමට පමණක් නොව පරලොව වශයෙන් සිදුවිය හැකි අපාදුකින් නිදහස්වීමට ද හැකියාව ලැබේ. එමනිසා සීලය සුගතිගාමීවීමේ ඉනිමගක් ලෙස සඳහන් ව තිබේ (සග්ගාරෝහණ සෝපානං සීලං අඤ්ඤසමං කුතො). ඒ අතර සසර දුකින් සපුරා නිදහස්වීමට ද සීලයෙන් ලැබෙන පිටිවහල අනල්ප ය.

සිල්වත් බවෙහි ප්‍රධාන ලක්ෂණය නම් කායික - වාචසික සංවරයයි. ඒ අනුව කායිකව සිදුවන ප්‍රාණඝාතය, සොරකම, කාමමිථ්‍යාචාර යන ත්‍රිවිධ දුෂ්චරිතයෙන් වෙන් වීමත් වාචසික සිදුවන බොරුව, කේලම, පරුෂවචන, හිස්වචන යන භාෂාව වැරදි ලෙස භාවිත කරන ස්වභාවයෙන් වැළකීමත් ය. මෙලෙස කායික වාචසික දුසිරිත්වලින් තොරව දිවිගෙවන සිල්වත් තැනැත්තාට මහත් සහනයක් සැලසෙන අතර ඔහු ඇසුරු කරන සමීපතමයන්ට ද එමගින් පහසුව සතුට උදාවේ. තවද එම පුද්ගලයාගේ සිල්වත්බව නිසා දෙවියන්, මියගිය ඤාතීන් ආදීන්ගේ ද ආශීර්වාදය ලැබෙන අතර තමන් සිදුකරන කටයුතු වඩාත් සාර්ථකව සපුරා ගැනීමට ද හැකියාව ලැබේ.

යමකු නිතර සිල්වත්ව ක්‍රියා කරයි නම් ඔහුගේ සිල්වත්බව සිහිපත් කොට එය භාවනාවක් ලෙස නැවත නැවත මෙනෙහි කිරීමෙන් සිත එකඟ කර ගැනීමට ද අවස්ථාව ලැබේ. එය සීලානුස්සති භාවනාව ලෙෂ දස අනුස්සති භාවනා අතර දක්වා තිබේ. සිල්වත් තැනැත්තාගේ මෙලොව ජීවිතයේ සිදුකරන අධ්‍යාපනික, ආර්ථික කටයුතු සඵල වන අතර එමගින් දැහැමිව තම ධනසම්පත් වර්ධනය කර ගැනීමට ද හැකියාව ලැබේ. ඒ අතර ඕනෑම පිරිසක් අබියසට නිර්භයව නොපැකිළව යාමේ ආත්මශක්තිය ද සීලය තුළින් වර්ධනය වේ. මරණින් මතු සුගතිගාමී වීමට ද සිල්වත්බව මහත් උපකාරයකි.

බුදුදහමින් පෙන්වා දී ඇති සීලය මගින් සිදු කෙරෙන්නේ හුදෙක් කය වචනය සංවර කර ගෙන සිටීම පමණක් නොව සිල්පද ආරක්ෂා වන ආකාරය මෙන් ම සිල්පද බිඳෙන ආකාරය පිළිබඳව හා ඊට බලපාන ආසන්නතම හේතු මොනවාද යන්න පිළිබඳව ද එමගින් පෙන්වා දී තිබේ. ඒ අනුව ප්‍රාණඝාතය සිදුවීමට ආසන්තම හේතුව ද්වේෂයයි. සොරකමට හේතුව තෘෂ්ණාව වන අතර කාමමිථ්‍යාචාරය සිදුවන්නේ ද තෘෂ්ණාව පාදක කර ගෙනයි. බොරුකීමට ආසන්නතම හේතුව ලෝභය වන අතර කේලමට හා පරුෂවචනයට හේතුව ද්වේෂයයි. හිස්වචනයට හේතුව මෝහයයි. මෙලෙස තමා තුළ කිසියම් සීලයක් ආරක්ෂා වෙනවා නම් ඊට හේතුව කුමක්ද යන්නත් කිසියම් සිල්පදයක් බිඳෙනවා නම් ඊට හේතුව කුමක්ද යන්නත් බෞද්ධ ශ්‍රාවකයාට අවබෝධයක් තිබීම අවශ්‍ය කෙරේ. බුදුදහමින් වදාළ සැබෑ සීලය සම්පූර්ණ වන්නේත් සීලයෙන් අපේක්ෂිත නියම ප්‍රතිඵල ලැබෙන්නේත් එවිටයි. ඒ අතර හුදෙක් ප්‍රාණඝාතාදියෙන් වළකින අතර අන් සත්ත්වයන්ගේ ජීවිත සුරක්ෂිතකරලීම් වශයෙන් අකුසලට විරුද්ධ කුසලය ප්‍රගුණ කිරීම ද සීලය වඩාත් පරිපූර්ණවීමට හේතු වේ.

සමාජගත ජීවිතයේ දී නුවණැති තැනැත්තකු සමාජයෙන් බලාපොරොත්තු වන ප්‍රධාන කරුණක් නම් කීර්තියයි. එය තම ධනයට හෝ බලයට වඩා උසස් දෙයකි. සමාජයෙහි හොඳ නමක් දිනාගෙන කීර්තිමත්ව ජීවත් වීමට සිල්වත් ජීවිතයට මහත් සේ උපකාරී වේ. සිල්වත් තැනැත්තා ගැන සමාජයෙහි විශාල ගෞරවයක් විශ්වාසයක් ගොඩනැගෙන අතර එය අන් කිසිදු දෙයකින් ලබාගත හැක්කක් නොවේ. මෙලෙස සිල්වත් වූ පමණට අන් අය ඒ ගැන කතාබහ කරන අතර සමාජයෙහි විශ්වසනීය කටයුතුත්තකදී සිල්වතා ද ඊට සම්බන්ධ කර ගැනේ. එපමණක් නොව මෙම කීර්තිය නිසා ම ඔහුට දැහැමිව මහත් ධනයක් උපයා ගැනීමට ද අවස්ථාව ලැබේ.

බුදුදහමින් දක්වෙන සීලය මනා ලෙස සම්පූර්ණ වීමට නම් තම සිත මැනැවින් පිහිටුවා ගැනීම අවශ්‍ය කෙරේ. එනම් සම්මා සංකල්ප හෙවත් යහපත් සිතිවිලිවලින් යුක්ත වීමයි. සංකල්ප (සිතිවිලි) යහපත් වන්නේ මනා දැක්මක් හෙවත් සම්මා දිට්ඨිය ඇති විටයි. සම්මාදිට්ඨිය ඇති වන්නේ මනා අවධානයෙන් යුතුව සද්ධර්මය ශ්‍රවණය කොට නුවණින් මෙනෙහි කළ පමණටයි. සම්මාදිට්ඨියෙන් යුතුව සිල්වත් වන විට තමා රකින සීලය තමාට පහසුවක් සහනයක් මෙන් ම සුවයක් ද වනු ඇත. සීලය නිතර ම ප්‍රඥාව සමග එකට සමගාමීව සුරැකි පමණට එය වඩාත් ම අර්ථවත් වන අතර එය නිවන සඳහා ද උපකාරවත් වේ. එක් අතකින් අනෙක් අත දෝවනය කරන්නාක් මෙන් සීලයෙන් ප්‍රඥාවත් ප්‍රඥාවෙන් සීලයත් පාරිශුද්ධත්වයට පරිපූර්ණත්වයට පත්වන බව සඳහන් වේ. තවද තමා රකින සීලය සමාධියට උපකාරයක් පිණිස භාවිත කළහොත් සමාධියෙහි දියුණුව සඳහා තව තවත් කායික වාචසික සංවරය තුළින් සිල්වත්බව දියුණු කර ගැනීමට පෙළඹෙනු ඇත. සිත සමාධිමත් වන විට දිට්ඨධම්මවේදනීය වශයෙන් ම මහත් සහනයක් සතුටක් ලැබීම ඊට හේතුවයි.

බුදුදහමින් වඩාත් අගය කරන්නේ මනා දැක්මකින් යුතු දෘෂ්ටිවලට නොවැටුණු මැදුම් මගෙහි ගමන් කරන (දිට්ඨිං ච අනුපගම්ම සීලවා දස්සනෙන සම්පන්නො) සීලයයි. එනම් ධර්ම මාර්ගය ආරම්භයේ දී ම පටිච්චසමුප්පාදය පදනම් කොටගත් අනිත්‍යතාව පිළිබඳ මනා දැක්මක් ඇති කර ගත යුතු බවයි. එනම් ඇස්, කන්, නාසාදි ඉන්ද්‍රිය ඔස්සේ රූප, ශබ්ද, ගන්ධාදි අරමුණු විෂයයෙහි කිසියම් දැනුමක් ලැබීමේ දී එම අද්දැකීම වර්තමානයෙහි හටගෙන ඉතිරි නැතිව නිරුද්ධ වන බව පිළිබඳ අවබෝධයයි. ඉන්ද්‍රිය සංජානනය තුළින් නිතර ම රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පංචකය ගොඩනැගෙන අතර එය පෙර නොතිබී හටගෙන ඉතිරි නැතිව නිරුද්ධ වන බවත් (අහුත්වා සම්භූතං හුත්වා න භවිස්සති) එම අද්දැකීම අනාගතයට නොයන බවත් පිළිබඳ වැටහීමයි. රූපාදි ස්කන්ධ පංචකයෙහි හටගැනීම (සමුදය) දකින තැනැත්තා 'නැත' (උච්ඡේද) යන අන්තයෙන් දුරු වේ. ස්කන්ධ පංචකයේ වැය (වය) දකින තැනැත්තා 'ඇත' (ශාශ්වත) යන අන්තයෙන් දුරුවේ. මෙලෙස පටිච්චසමුප්පාදය නමැති එක ම දර්ශනයෙන් ඇත හා නැත යන අන්ත දෙක ම දුරු වී මධ්‍යම ප්‍රතිපදාවට පිවිසීම අවශ්‍ය කෙරේ.

ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි දක්වෙන පරිදි සම්මාදිට්ඨිය පෙරටුව යමකු ආර්ය මාර්ගයෙහි ගමන් කරයි නම් කායික සංවරයට ප්‍රථම වාචසික සංවරය දියුණු වේ. එදිනෙදා කටයුතු කිරීමේ දී තම වචන භාවිතයේ දී හැකිතාක් දුරට මනා සිහියෙන් හා නුවණින් යුතුව වඩාත් ඵලදායී ලෙස වචන භාවිත කෙරේ. බොහෝ දෙනා සමාජගත ජීවිතයේ දී අපහසුතාවට හා පසුතැවිල්ලට පත් වන්නේ වචන හුවමාරු කර ගැනීමේ දී සිදුවන අදූරදර්ශී භාවය නිසයි. එම නිසා වචන භාවිතයේ දී යළි යළිත් නුවණින් මෙනෙහි කිරීම (*පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා වාචාය කම්මං කාතබ්බං*) වැදගත් වේ.

සිල්වත් බවෙහි පිහිටා භාවනා කරන ශ්‍රාවකයාගේ සිත සමාධිමත් වන අතර එපමණට සතුට ද වැඩිවන අතර එම සතුටත් සමග ඉතා සුළු වරදින් පවා වැළකෙමින් වඩ වඩාත් සිල්වත් වීමට උත්සාහ කරයි (*අනුමත්තේසු වජ්ජේසු භයදස්සාවී*). ඒ අතර සීලයත් සමඟ සමාධිය දියුණු කිරීමෙන් සීල, සමාධි, පඤ්ඤා, විමුත්ති, විමුත්තිඤාණදස්සන යන පංච ධර්මයන්හි ම පරිපූර්ණත්වයට පත්වීමට අවස්ථාව උදාවේ.

මජ්ඣිම නිකායෙහි ආකංඛෙය්‍ය සූත්‍රයෙහි සීලයෙහි ආනිසංස රැසක් විස්තර කොට තිබේ. ඒ අනුව සිල්වත් වන පමණට,

තමා සමඟ වාසය කරන්නවුන්ගේ (සබ්‍රහ්මචාරීන්ගේ) සිත් දිනා ගැනීම

සිව්පසය මැනැවින් ලැබීම

සිව්පසය දෙන අයට පින්සිදුවීම

පරලොව ගිය අයට පින් සිදුවීම හා ඒ අයගේ ආශීර්වාදය ලැබීම

කුසලදහම් නොඇලීම හා අකුලයන්හි ඇලීම  යන දුර්වලතා මැඩ පැවැත්වීම

බිය තැතිගැනීම් අරමුණු මැඩ පැවැත්වීම

සිතෙහි සතුට දියුණුවන ප්‍රථම ධ්‍යාන ආදි රූප ධ්‍යාන හතර ලැබීම

රූපී තත්ත්වය ඉක්මවා ආකාසානඤ්ඤායතන ආදි අරූප ධ්‍යාන හතර ලැබීම

ත්‍රිවිධ සංයෝජන දුරැලා සෝවාන් වීම

රාග, ද්වේෂ තුනී කොට සකදාගාමී වීම

රාග, ද්වේෂ සපුරා ප්‍රහීණ කොට අනාගාමී විම

ඉද්ධිවිධ ආදි අභිඥා ලැබීම

සියලු කෙලෙස් ප්‍රහීණ කොට රහත්වීම

යන ආනිසංස මේ ජීවිතයේ දී ම සලසා ගැනීමට අවස්ථාව උදාවේ. ඒ සඳහා සිතෙහි සමාධිමත් බව සහ විදර්ශනා ඥානය ද උපකාරී වේ.

වරෙක බුදුරදුන් වෙත පැමිණි දෙවියකු නැඟූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් ගැටලුවලින් නිදහස්වීමේ මග වශයෙන් භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කළේ සීලයෙහි පිහිටා සමථ විදර්ශනා වඩන ලෙසයි. එහි දී ගැටලුවලින් නිදහස්වීමේ මූලික පදනම වශයෙන් දේශනා කළේ සීලයයි.

මනා දර්ශනයකින් යුතුව පිරිසිදු සීලයක පිහිටා සිත වැඩූ පමණට සිත සමාධිමත් වන සමාධිමත් වූ සිතින් ලෝක යථාර්ථය තේරුම් ගැනීමට අවකාශ උදාවේ (සමාහිතො භික්ඛවේ යථාභූතං පජානාති.). එලෙස ලෝක යථාර්ථය ප්‍රත්‍යක්ෂ කර ගැනීමට අවස්ථාව ලැබෙන්නේ ධර්ම මාර්ගය ආරම්භයේ දී ම කලණ මිතුරු ඇසුරින් පටිච්චසමුප්පාදය පදනම් කොටගත් ත්‍රිලක්ෂණය පිළිබඳ මනා වැටහීමක් ඇති කර ගැනීමෙනි.

# ඔබ සැමට තෙරුවන් සරණයි!

## ලොස් ඇන්ජලිස් බෞද්ධ විහාරය - පැසදිනා - කැලිෆෝනියා